පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 12

විෂයය:- සිංහල

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# ප්‍රත්‍යාර්ථ නාම

සරල හැඳින්වීමක් :

ප්‍රත්‍යය + අර්ථ = ප්‍රත්‍යාර්ථ

ඒ අනුව මෙහි අර්ථය වනුයේ "ප්‍රත්‍යය නිසා අර්ථ ගැන්වෙන නාම" යනු යි. ප්‍රත්‍යය භාවිතයෙන් අර්ථ ගැන්වීමට ,

- නාම ප්රකෘති
- ධාතු ප්රකෘති

යන අංග 02 වැදගත් වේ.

නාම ප්‍රකෘතිය → නාම පදයකට මුල් වන කොටස

ධාතු ප්‍රකෘතිය → ක්‍රියා පදයකට මුල් වන කොටස

* නාම ප්රකෘතියකට ප්රත්යයක් එක් වීමෙන් සෑදෙන ප්රත්යාර්ථ නාම **තද්ධිත** ලෙස හැඳින් වේ.

* ආඛ්යාත ප්රකෘතියකට (ධාතු ප්රකෘතියට) ප්රත්යයක් එක් වීමෙන් සෑදෙන ප්රත්යාර්ථ නාම **කෘදන්ත** ලෙස හැඳින් වේ.

## තද්ධිත

කුමාරතුංග මුනිදාස මහතා තද්ධිත පද 23ක් දක්වා ඇත.

**ඉ, මුවා, මය, වත්, මත්, තර, තම, ඉති, අටි, අටු, අස්, අත්, බ, තා, ආණ, අණු, අණි, එක්, උ, අළ, ආ, උතු**

11 ශ්‍රේණිය පෙළ පොතේ තද්ධිත පාඩම (146 පිටුව) හොඳින් කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ පහත ඉදිරිපත් කර ඇති එක් එක් අදහස සඳහා සුදුසු තද්ධිත පදය ලියන්න.

01 තොටෙහි නියුතු වූයේ
02 ශිල්ප ශාස්ත්රය දන්නේ
03 සිල් ඇත්තේ
04 දිරිය ඇත්තේ
05 ධනය ඇත්තේ

06 රුව ඇත්තේ
07 ශක්තිය ඇත්තේ
08 බුද්ධි ඇත්තේ
09 මෙලෙකට හුරු වූයේ
10 යකඩයෙන් කරන ලද
11 දැවයෙන් කරන ලද
12 කර ප්රදේශය
13 දෙදෙනෙකු අතරින් ශ්රේෂ්ඨ
14 සියල්ලන් අතරින් උතුම්
15 පුරාණ කාලයට අයත්
16 සංස්කෘතියට අයත්
17 කැඳ ස්වල්පයක්
18 ගරු කටයුතු රජතුමා
19 ගරු කටයුතු මව
20 මරණයට තුඩු දෙන
21 විදේශයට අයත්
22 ප්රදේශයට අයත්
23 නිහඬ බව
24 විශේෂ බව
25 රස ඇත්තේ